**සබරගමුව පළාත් සභාව**

**சபரகமுவ மாகாண சபை**

**SABARAGAMUWA PROVINCIAL COUNCIL**

***2017 සැප්තැම්බර් මස 12 අඟහරුවාදා දින***

*2017 செப்டெம்பர் மாதம் **12** ஆம் திகதி செவ்வாய்க்கிழமை*

***Tuesday 12 th September 2017***

ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමාගේ මූලාසනාරූඪත්වයෙන් පෙ.ව.10.40 ට සභාව රැස්විය.

கௌரவ தவிசாளர் - கஞ்சன ஜயரத்ன அவர்களின் தலைமை வகித்தார்கள் மு.ப. 10.40 மணிக்கு சபைக் கூடியது.

The Council met at 10.40 a.m Hon.Chairman Kanchana Jayarathna preside the Chair

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

සියළුදෙනාටම සුභ උදෑසනක් වේවා ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි, ඒ වගේම ගරු අමාත්‍යතුමන්ලා, ඒ වගේම විපක්ෂනායකතුමා ප්‍රමුඛ සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා, ඒ වගේම මන්ත්‍රීතුමියගෙන් අවසරයි. අද දිනට න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා පළමුවෙන්ම තිබෙන්නේ,

අභිනව මන්ත්‍රීවරුන්ගේ ප්‍රතිඥා හෝ දිවුරුම්දීම් : නැත

ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ :

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***

*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*

---------------------------------------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව වූ ගරු ආණ්ඩුකාරතුමාගේ ලිපිය පිළිබඳව ගරු සභාවට දැනුම් දීම. ගරු ආණ්ඩුකාරතුමා විසින් සභා ලේකම් වෙත එවා තිබූ නිවේදනය.

සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 20 වන සංශෝධන පනත් කෙටුම්පත.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් පහත සඳහන් වැදගත් කරුණු ප්‍රථමයෙන් මවිසින් සඳහන් කළයුතුව ඇත.

01. මීට අදාළව 2017.08.17 දාතමින් යුතුව අතිගරු ජනාධිපතිතුමන් පෞද්ගලිකව අත්සන් තබන ලද 2017.08.21 වන දින මාගේ කාර්යාලයට ලැබුණු සීඑන්ඒ/9/96 අංක දරණ ලිපියේ 02 ඡේදය ප්‍රකාරව මේ සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාවේ අදහස් ප්‍රකාශනයක් එකී ලිපිය ලැබී දින 14 ක් ඇතුළත අතිගරු ජනාධිපතිතුමා වෙත ලැබීමට සැළැස්විය යුතුව ඇත. මේ වනවිට දින 14 ඉක්මවා ගොස් ඇති නමුත්

එම ප්‍රකාශනයක් අතිගරු ජනාධිපතිතුමා වෙත ඉදිරිපත් කර නොමැත.

02. මේ පිළිබඳව මවිසින් සභාව දැනුවත් කරන ලද අතර ඒ අනුව 2017 අගෝස්තු මස 28 දිනයේ මෙම පනත් කෙටුම්පත පිළිබඳ යෝජනා සාකච්ඡාවට ගත් අතර එම පනතට සංශෝධනයන් එක් කිරීමට ඇති බවට අතිගරු ජනාධිපතිතුමන් කරන ලද පූර්ව දැනුම්දීම හේතුකොට ගෙන මවිසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට ඒ බව දන්වා ඒ වනතෙක් සභාව කල් තබන ලෙස ඉල්ලා සිටින ලදී.
එහි ප්‍රතිඵලයක් ලෙස සභාව විසින් මෙම සංශෝධන ඉදිරිපත් කරන තෙක් 2017.09.12 වන දිනට සභාව කල් තබන ලද අතර එකී දිනය තීරණය කරන ලද්දේ සබරගමුව පළාත් සභාව විසින් මිස මවිසින් නොවේ.

03. එහෙත් අද වනතුරු අතිගරු ජනාධිපතිතුමාගේ සංශෝධන ලැබී නැති හෙයින් ඒම යෝජනාවට යථා කාලයේ අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන සංශෝධනයන් සහිතව හෝ යටත්ව මෙම යෝජනාව ඉදිරිපත් කළයුතුව තිබේ.

04. මෙම තත්ත්වය මෙසේ තිබියදී සබරගමුව පළාත් සභාවේ මන්ත්‍රීවරුන් 24 ක් හෝ 25 දෙනෙක් පමණ 2017.09.10 වන දින මා හමුවී මා හා ප්‍රකාශ කර සිටියේ ඔවුන්ට 2017.09.12 රැස්වීමේ න්‍යාය පත්‍රයට මෙම යෝජනාව ඇතුළත් කර නොමැති බවයි. ඔවුන් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිනු ලැබුවේ 2017.08.28 වන දින එම යෝජනාව සාකච්ඡාවට ගනු නොලබන ලද්දේ මාගේ ඉල්ලීමට අනුව බවත් එබැවින් මේ සම්බන්ධයෙන් මාගේ මැදිහත්වීම අවශ්‍ය බවත්ය.

05. සාමාන්‍යයෙන් අනුගමනය කළයුතු සම්ප්‍රදාය වන්නේ රැස්වීම් දිනක සාකච්ඡාවට භාජනය කළයුතු කරුණු ඊළඟ දිනයේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමය. මේ සම්බන්ධව ඉහත සඳහන් කරන ලද කරුණු වලට අමතරව මෙම යෝජනාව සැප්තැම්බර් මස 12 වන දින රැස්වීමේ දී විවාදයට ගැනිය යුතු බවට වන විශේෂ කරුණු කිහිපයක් පහත සඳහන් කරමි.

(අ) වර්තමාන තත්ත්වය හා පුවත්පත් මඟින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව මෙම මස අවසානයේ සබරගමුව පළාත් සභාවේ නිල කාලය අවසන් වන බැවින් එය විසුරුවා හැරීමට ඉඩකඩ ඇත.
එසේ නම් සැප්තැම්බර් මස 12 වන දින රැස්වීම මෙම සභාවේ අවසන් රැස්වීම වීමට ඉඩකඩ ඇත. එසේ වුවහොත් සභාව විසුරුවා හරින අවස්ථාව වනවිට අතිගරු ජනාධිපතිතුමාගේ ඉල්ලීම අනුව මෙකී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වන සබරගමුව පළාත් සභාවේ මතය එතුමා වෙත දන්වා යැවිය නොහැකි තත්ත්වයක් උදාවනු ඇත.

(ආ) එසේම 2017.09.12 වන දින න්‍යායපත්‍රයට මෙම කරුණු ඇතුළත් නොකළත් එම දිනයට පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ මෙම පනත් කෙටුම්පත සබරගමුව පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කළයුතු

බවට වන මන්ත්‍රීවරුන්ගේ යෝජනාවක් ඇතුළත් කර ඇත.

මෙම සියළු කරුණු සළකා බලා සැප්තැම්බර් මස 12 වන දිනට පවත්වනු ලබන රැස්වීමේ න්‍යායපත්‍රයේ අංක 02 ගරු ආණ්ඩුකාරතුමාගෙන් ලැබෙන සංදේශ යටතේ අගෝස්තු මස 28 වන දින කල් තබනු ලැබූ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ 20 වන සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව සබරගමුව පළාත් සභාවේ අදහස් ප්‍රකාශනය සඳහා සාකච්ඡාවට ගැනීමට අවශ්‍ය කටයුතු සළසන ලෙස මවිසින් ඔබතුමියට මෙයින් නියෝග කරමි.

මාෂල් පෙරේරා,
ආණ්ඩුකාරවර,
සබරගමුව පළාත.

ගරු ආණ්ඩුකාතුමා විසින් එවන ලද ලිපියේ පිටපතක් ඔබතුමන්ලාගේ දැන ගැනීම සඳහා මේසය මත තබා තිබෙනවා. එසේම 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පිටපතක් ද සභා මේසය මත තබා තිබෙනවා.

ඒ අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්බන්ධයෙන් සබරගමුව පළාත් සභාවේ අදහස් හා ප්‍රකාශයන් ලබාගැනීම සඳහා සභා න්‍යායපත්‍රයේ අංක 14 පළාත් සභාවේ පොදු කටයුතු යටතේ අවස්ථාව ලබාදෙනවා.

ගරු සභාපතිතුමාගේ නිවේදන :

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

සබරගමුව පළාත් කාර්යය සාධන වාර්තාව 2006 ලැබිලා තියනවා. ඒක අපි සභාගත කිරීමට කටයුතු කරනවා. එහි පිටපත් ඔබතුමන්ලාට ලැබෙන්න සළස්වනවා.

නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා :

ගරු අමාත්‍ය ශ්‍රීලාල් වික්‍රමසිංහ මැතිතුමා.

ගරු මන්ත්‍රී නමින්ද අනුරප්‍රිය මැතිතුමා.

ඉහත නම් සඳහන් ගරු මැති ඇමතිතුමන්ලා හට නිවාඩු අනුමත විය.

ලිපි ලේඛණ පිළිගැන්වීම : නැත

කාරක සභා වාර්තා පිළිගැන්වීම : නැත

පෙත්සම් : නැත

ප්‍රශ්න : නැත

අමාත්‍යාංශ නිවේදන හෝ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ : නැත.

පෞද්ගලික ප්‍රකාශ කිරීම් :

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

මේ යටතේ ගරු ජී.එම්.කරුණාපාල මැතිතුමාට අවස්ථාව.

***ගරු මන්ත්‍රී ජී.එම්.කරුණාපාල මැතිතුමා.***
*கௌரவ உறுப்பினர் ஜீ.எம்.கருணாபால* *Hon.Member G.M.Karunapala*
------------------------------------------

ගරු සභාපතිතුමනි, ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව ප්‍රධාන කාර්යාලය ස්ථාපිත වෙලා අවුරුදු කීපයක්. සබරගමුවේ කෑගල්ල දිස්ත්‍රික්කයත්, කෑගල්ල දිස්ත්‍රික්කයත් අතර අවිස්සාවේල්ලේ ස්ථාපිත වෙලා තිබුණ ප්‍රධාන කාර්යාලය වරකාපොල ප්‍රදේශයට ගෙන යෑමේ වැඩ පිළිවෙලක් තියනවා. මෙහි දැනට අවිස්සාවේල්ල නගරයේ හා ඇහැළියගොඩ, රුවන්වැල්ල ආදී අවිස්සාවේල්ලට ආසන්න ප්‍රදේශවල සේවය කරන එකසිය ගාණක් මෙහි සේවය කරනවා. බස්රථවලට අවශ්‍ය උපකරණ විශේෂයෙන් ටයර් ගබඩාව පිහිටා ඇත්තේ ඇඹිලිපිටියේ. මේ ආදී වශයෙන් වඩාත්ම සුදුසු වෙලා තියෙන්නේ ලංකා ගමනා ගමන මණ්ඩලයේ සබරගමුව අවිස්සාවේල්ලේ ස්ථාපිත වීම තමයි මැනවින්ම අවශ්‍ය වන්නේ. ඒ නිසා තමයි ඒක අද වෙනතෙක් එම ස්ථානයේ පවත්වාගෙන යන්නේ. මේකට විවිධ යෝජනා ඇවිල්ලා වරකාපොල ප්‍රදේශයට ගෙන යෑමට කටයුතු කරන වග මෙහි සේවක පිරිස හා නිළධාරී පිරිස අප වෙත දැනුම් දීලා තියනවා. ඒකේ සංදේශය ඔබතුමාට බාරදීලා තියනවා. ඒ නිසා මෙන්න මෙයට සමස්තයක් වශයෙන් අපි ඔක්කෝම විරුද්ධ වෙලා මෙය අවිස්සාවේල්ලේම ස්ථාපිත වීම වඩාත් වැදගත් යැයි මගේ මතය.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
---------------------------------------------------------

ස්තුතියි ! ගරු ජී.එම්.කරුණාපාල ගරු මන්ත්‍රීතුමාට.

ශෝක ප්‍රකාශ යෝජනා : නැත

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය නොවන යෝජනා : නැත

පොදු කටයුතු ආරම්භයේ දී දැනුම් දීමක් අවශ්‍ය යෝජනා : නැත

පළාත් සභාවේ පොදු කටයුතු :

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

මේ යටතේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡා කිරීම හා අනුමැතිය ලබා ගැනීමේ අවස්ථාව. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳ සාකච්ඡාව ආරම්භ කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමාට ආරාධනා කරනවා.

***ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.***
***கௌரவ பிரதான அமைச்சர்***
*Hon.Chief Minister Mahipala Herath*
***-----------------------------------------------***

ගරු සභාපතිතුමනි, ගරු ආණ්ඩුකාරතුමාගේ දැනුම් දීම අනුව 20 වන ආණ්ඩුක්‍රම සංශෝධන පනත ඉදිරිපත් කරන මේ අවස්ථාවේ ඒ සඳහා මේ සභාවේ සංශෝධන ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. 154 (ඇ) (ඇ) සියළුම පළාත් සභා විසිරෙන දිනය ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලැබිය යුතු වන්නේය. 154 (ඉ) (ඊ) යම් පළාත් සභාවක් විසුරුවා හරිනු ලබන අවස්ථාවක එම පළාත් සභාවේ බලතල නිශ්චිත දිනය තෙක් එම පළාත් සභාවේ කටයුතු ජනාධිපතිවරයාගේ නියම අනුව ආණ්ඩුකාරවරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතුය. මේ පාර්ලිමේන්තුව වෙත මේ බලය පැවරීමට නුසුදුසුයි කියන අදහස සාකච්ඡා කිරීමේ දී මෙම කරුණු අපට ඉදිරිපත් කරන්න සිද්ධ වෙනවා. සියළු පළාත් සභාවල මන්ත්‍රීවරුන් තෝරා ගැනීමේ ඡන්ද විමසීම එකම දිනයක පැවැත්විය යුතු අතර, නිශ්චිත දිනය තෙක් එම පළාත් සභාවේ දැනට සිටින සභිකවරුන්ගේ ධූර කාලය ද තිබිය යුතුය. මේ සංශෝධන අතර ගරු සභාපතිතුමනි, ඉදිරි පළාත් සභා මැතිවරණය අනුපාත සහ කේවල මිශ්‍ර ක්‍රමයට පැවැත්වීම. මෙන්න මේ සංශෝධන ගරු සභාව විසින් ඉදිරිපත් කරන ලෙස මම ඉල්ලීමක් කරමින් මම ගරු සභාවට මේ කරුණු ඉදිරිපත් කරනවා. මොකද ගරු සභාපතිතුමනි, අපි පළාත් සභාවක් ලෙස අපට ලැබී තිබෙන ඒ පළාත් සභාවේ අයිතිය මොනම හේතුවක් තුළින් හෝ අපි පාර්ලිමේන්තුව වෙත හෝ වෙනත් අමාත්‍යාංශයකට පැවරීම අපි නුසුදුසුයි කියන මතය අපි සාකච්ඡාවල දී අපේ ජනාධිපතිතුමාගෙත් මතය වුනා. ඒ නිසා එතුමාගේ වාචික අදහසුත් මේ අනුව තිබුණා. ඒ නිසයි මේ කරුණු අපි සාකච්ඡා කරලා ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මේ අවස්ථාවේ දී සභාවේ මේ සඳහා අවධානය යොමු කරන ලෙස ගරු විපක්ෂනායකතුමා ඇතුළු විපක්ෂ කණ්ඩායමෙනුත් අපි ඉල්ලා සිටිනවා.

***ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.***
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-----------------------------------------------------------

ස්තුතියි ! ගරු ප්‍රධාන අමාත්‍යතුමනි. මීළඟට ගරු විපක්ෂනායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා.*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
---------------------------------------------

සමාවෙන්න ගරු සභාපතිතුමනි, මේ විදිහේ සංශෝධන ඇතුව මේ සභාවේ යෝජනාව මේක අනුමත කර දෙන ලෙසත් මම ඉල්ලා සිටිනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා.*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

හොඳයි, හොඳයි. මීළඟට ගරු විපක්ෂනායකතුමා.

*ගරු විපක්ෂ නායක ඩබ්ලිව්.සෝමදාස මැතිතුමා*
*கௌரவ எதிர்க் கட்சித் தலைவர் டபிள்யு சோமதாச*
*Hon.Opposition Leader W.Somadasa*
------------------------------------------------------------

ගරු සභාපතිතුමනි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබාදීම ගැන. 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පිළිබඳව සාකච්ඡා කර අනුමැතිය ලබාගැනීම යෝජනාව යටතේ වචන කීපයක් කතා කරන්න මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලනවා. යහපාලන ආණ්ඩුව පිහිටුවන්න පෙර ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් පැහැදිලිවම කියපු දේ තමයි කඩින්කඩ පවත්වන මැතිවරණ කල් දාලා කටයුතු කරන ඒවා අපි වෙනස් කරන්න ඕනේ එක දිනයකදී මැතිවරණ පවත්වන්න ඕනේ කියලා එතුමාගේ අදහස වුණා. ඒවගේම එතුමන්ලා මේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ඒ යෝජනාව ගෙනාවා. මේ වෙලාවේ විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපි සූදානමින් ඉන්නවා මේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කරන්න. ඒ සංශෝධනවලට යටත්ව මේක අපි අනුමත කරනවා. මීට වඩා අපිට කතා කරන්න දෙයක් නෑ. මං හිතන්නේ ආණ්ඩු පක්ෂයෙන් ඒක ප්‍රකාශ වුණේ නෑ ප්‍රධාන ඇමතිතුමාගෙන්. අපි බලාපොරොත්තු වෙනවා මේ 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුමත කරන්න.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
-------------------------------------------------------------

ස්තුතියි විපක්ෂනායකතුමනි. ඒ අනුව පළාත් සභාවේ පොදු කටයුතු යටතේ ඉදිරිපත් කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත සම්මත කිරීමට මේ සඳහා සභාවේ එකඟතාවය ලබාගැනීමේ අවස්ථාව. ඒ අනුව මේ පනත සම්මත කර ගැනීම සඳහා මේ මහා සභාව කාරක සභාවක් බවට පත් කරනවා.

ස්තුතියි ඔබතමුන්නාන්සේලා සියළු දෙනාටම. කාරක සභාවක් බවට පත්වීමෙන් අනතුරුව 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව ඡන්දය විමසීම සඳහා ඊට පක්ෂ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අත් ඔසවන්න.

**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ ගරු මැති ඇමතිතුමන්ලා:-**

01. ගරු මහීපාල හේරත් මැතිතුමා
02. ගරු අතුල කුමාර රාහුබද්ධ මැතිතුමා
03. ගරු ප්‍රභාත් භාණු මුණිප්‍රිය මැතිතුමා
04. ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා
05. ගරු අසෝක ජයවර්ධන මැතිතුමා
06. ගරු හර්ෂ සියඹලාපිටිය මැතිතුමා
07. ගරු කේ.රාමචන්ද්‍රන් මැතිතුමා
08. ගරු ඉම්තියාස් කාදර් මැතිතුමා
09. ගරු ආනන්ද මිල්ලන්ගොඩ මැතිතුමා
10. ගරු වරුණ ලියනගේ මැතිතුමා
11. ගරු පරාක්‍රම අතාවුද මැතිතුමා
12. ගරු සලිත කරුණාරත්න මැතිතුමා
13. ගරු ප්‍රභාත් මහේෂ් ද අල්විස් මැතිතුමා
14. ගරු චමිල තිවංක දිසානායක මැතිතුමා
15. ගරු අන්නමලෙයි බාස්කරන් මැතිතුමා
16. ගරු ඩබ්.සෝමදාස මැතිතුමා
17. ගරු සිරිපාල කිරිඇල්ල මැතිතුමා
18. ගරු අජිත් කුමාර මැද්දෙගම මැතිතුමා
19. ගරු එම්.වයි.එම්.ඉෆ්ලාර් මැතිතුමා
20. ගරු නිමල් විජේනායක මැතිතුමා
21. ගරු සමිත ආටිගල මැතිතුමා
22. ගරු නිහාල් ෆාරුක් මැතිතුමා
23. ගරු පී.අබේනායක මැතිතුමා
24. ගරු ලක්ෂ්මන් කොඩිකාර මැතිතුමා
25. ගරු කේ.එල්.රත්නායක මැතිතුමා
26. ගරු සිරිල් පල්ලේපොල මැතිතුමා
27. ගරු උපුල් ශ්‍යාමල් බණ්ඩාර මැතිතුමා
28. ගරු රංජිත් පොල්ගම්පොල මැතිතුමා
29. ගරු බී.ආරියවංශ මැතිතුමා

ස්තුතියි ඔබතමුන්නාන්සේලාට. මීළඟට විරුද්ධ අය අත් ඔසවන්න.

**20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පතට විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළ ගරු මැතිතුමන්ලා:-**

01. ගරු අනුර අලගියවන්න මැතිතුමා
02. ගරු ගරු අජිත් ශාමින්ද මැතිතුමා
03. ගරු අරුණ නිලන්ත ජයසිංහ මැතිතුමා
04. ගරු රම්‍යකුමාර වීරසිංහ මැතිතුමා
05. ගරු දීපාල් ගුණසේකර මැතිතුමා
06. ගරු අකිල සාලිය එල්ලාවල මැතිතුමා
07. ගරු වත්සලා ජිනාදරී පද්මසිරි මැතිණිය
08. ගරු ඉඳුනිල් ශාන්ත ගුණසේන මැතිතුමා

හොඳයි. මීළඟට විපක්ෂනායකතුමා තත්පරයක් ඉන්න. මීළඟට ප්‍රදානය ප්‍රකාශ කිරීම සඳහා කාරක සභාව මහා සභාවක් බවට පත් කරනවා.

ස්තුතියි තමුන්නාන්සේලා සියළු දෙනාටම. කාරක සභාවක් බවට පත් කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව පැවති ඡන්ද විමසීම අනුව නොපැමිණි මන්ත්‍රී සංඛ්‍යාව තුනයි. ඡන්දය ගන්නා අවස්ථාවේ සභාවේ නොසිටි මන්ත්‍රී සංඛ්‍යාව තුනයි. පනතට පක්ෂව ඡන්ද 29 යි. පනතට විපක්ෂව ඡන්ද 8 යි. ඒ අනුව වැඩි ඡන්ද 21 කින් 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සභා සම්මත වූ බව මේ ගරු සභාවට දැනුම් දෙනවා.

*ගරු ප්‍රධාන අමාත්‍ය මහීපාල හේරත් මැතිතුමා*
*கௌரவ பிரதான அமைச்சர்*
*Hon.Chief Minister Mahipala Herath*
-------------------------------------------

ගරු සභාපතිතුමනි මට පොඩි ප්‍රකාශයක් කරන්න තියෙනවා සභාවට. ත්‍රිවිල් ප්‍රඥප්තිය අපි සාකච්ඡා කිරීමෙන් පස්සේ ඒ ත්‍රිවිලර් සංගම් සමඟ ගන්නට කටයුතු කරන බව ගරු සභාවට දන්වනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

එතකොට මේ 20 වන සංශෝධනය පිළිබඳව තමුන්නාන්සේලා ඉදිරිපත් කරන්නේ සංශෝධන සහිතව තමයි සභාව සම්මත කිරීම සිද්ධ වෙන්නේ කියන එක දැනුම් දෙන්න ඕනේ.

මීළඟට ගරු සභානායකතුමා සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**සභාව කල් තැබීම :-**

*ගරු සභානායක අසෝක ජයවර්ධන මැතිතුමා*
*கௌரவ ஆ.கட்சி அமைப்பாளர் அசோக ஜயவர்தன*
*Hon.Gov.Whip Asoka Jayawardane*
-------------------------------------------------------

ගරු සභාපතිතුමනි මෙම ගරු සභාව 2017 සැප්තැම්බර් මස 26 වෙනි දින පෙරවරු 10.00 දක්වා කල් තැබීමට යෝජනා කරනවා.

*ගරු සභාපති කංචන ජයරත්න මැතිතුමා*
*கௌரவ தவிசாளர் கஞ்சன ஜயரத்ன* *Hon.Chairman Kanchana Jayarathna*
------------------------------------------------------------

ස්තූතියි ගරු සභානායකතුමාට. දැන් වේලාව පෙරවරු 11.00 යි. අද දිනට මෙම ගරු සභාවේ වැඩ කටයුතු අවසන් වෙනවා. මෙම ගරු සභාව සැප්තැම්බර් මස 26 වෙනි දින පෙරවරු 10.00 ට නැවත රැස් වෙනවා. බොහොම ස්තූතියි.

අත්/කළේ :

කංචන ජයරත්න
සභාපති,
සබරගමුව පළාත් සභාව.

පී.එස්.ආර්.එම්.විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ක් වූ සැප්තැම්බර් මස 14 වෙනි දින,
සභා ලේකම් කාර්යාලයේ දීය.

(අශෝධිත පිටපත)